*සැ. යු.* - 2025.04.11 වැනි දින පළ කරන ලද අංක 2432 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,433 - 2025 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2025.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 78 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 80 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මැයි මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අප්‍රේල් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

77 - B 082673 — 177 (2025/04)
C 1 -

# පිස්කල් විකිණීම

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පවත්වනු ලබන වාණිජ මහාධිකරණයේ දී ය

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

රිචඩ් පීරිස් ෆයිනෑන්ස් ලිමිටඩ්,
අංක 69, හයිඩ්පාර්ක් කෝනර්,
කොළඹ 02.

*නඩු අංකය* : CHC/590/2021/ARB ...............*පෙත්සම්කරු.*
*කොළඹ වාණිජ මහාධිකරණ*
*ඇස්කිසි අංකය* : 26/2024

*එදිරිව*

01. රෝලර් මාස්ටර් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 8/ඒ1,
විහාර මාවත, කොළොන්නාව.

02. විජයකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසිරි විජයකෝන් බණ්ඩාර,
අංක 10ඒ,
මීතොටමුල්ල පාර, කොළොන්නාව.

03. වෙදගේ දිල්මිණි ෆොන්සේකා සමරසේකර,
අංක 10ඒ,
මීතොටමුල්ල පාර, කොළොන්නාව.

...............*වගඋත්තරකරුවන්.*

වර්ෂ 2020ක් වූ දෙසැම්බර් මස 17 වන දිනැති "පෙ 10" ලෙස ලකුණු කර ඇති තීරක ප්‍රදානය අනුව පෙත්සම්කාර සමාගමට ණය ගිවිසුම මත අංක 8 ඒ/1, විහාර මාවත, කොළොන්නාව දරන ස්ථානයේ පදිංචි රෝලර් මාස්ටර් ප්‍රයිවට් ලිමිටඩ් යන 1 වන වගඋත්තරකරුට ද, අංක 10ඒ, මීතොටමුල්ල පාර, කොළොන්නාව දරන ස්ථානයේ පදිංචි විජයකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසිරි විජයකෝන් බණ්ඩාර යන 2 වන වගඋත්තරකරුට ද සහ අංක 10ඒ, මීතොටමුල්ල පාර, කොළොන්නාව දරන ස්ථානයේ පදිංචි වෙදගේ දිල්මිණි ෆොන්සේකා සමරසේකර යන 3 වන වගඋත්තරකරු ද විසින් ගෙවන ලද සියලු ගෙවීම් සඳහා බැරවාසිය ලබා දීමෙන් අනතුරුව,

*එනම්,*

සම්පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන් ඉල්ලුම්කාර සමාගම වෙත රුපියල් දොළොස් මිලියන හාර ලක්ෂ පනස් නව දහස් හත්සිය අනූපහ (රු. 12,459,795/-) ක මුදලක් ගෙවීමට වගඋත්තරකරුවන් එකඟ වූ බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

*එකී මුදල,*

i. වර්ෂ 2020 අගෝස්තු මස 30 වන දිනෙන් පටන් ගෙන වර්ෂ 2021 ජනවාරි මස 30 දක්වා රුපියල් එක්ලක්ෂ පනස් දහස (රු. 150,000/-) බැගින් වූ වාරික 06 කින් ද,

ii. වර්ෂ 2021 පෙබරවාරි මස 30 වන දිනෙන් පටන් ගෙන වර්ෂ 2021 ජූලි මස 30 දක්වා රුපියල් ලක්ෂ දෙක (රු. 200,000/-) බැගින් වූ වාරික 06 කින් ද,

iii. වර්ෂ 2021 ඔක්තෝබර් මස 30 වන දින වන විට අවසන් වාරිකය ලෙස දස මිලියන තුන් ලක්ෂ පනස් නව දහස් හත්සිය අනූපහ (රු. 10,359,795/-) ක් ද,

ලෙස සම්පූර්ණ වාරික 13කින් ගෙවා අවසන් කිරීමට වගඋත්තරකරුවන් එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

එසේම, වගඋත්තරකරුවන් විසින් මේ වන විට ඉහත කී වාරිකවලින් රුපියල් එක් ලක්ෂ පනස් දහස (රු. 150,000/-) ක් බැගින් වූ වාරික තුනක් වර්ෂ 2020 අගෝස්තු මස 27, වර්ෂ 2020 සැප්තැම්බර් මස 30 සහ වර්ෂ 2020 නොවැම්බර් මස 30 යන දිනයන් හි ගෙවා

ඇති බව ඉල්ලුම්කාර සමාගම විසින් තහවුරු කරන ලද බැවින් එකී කරුණු ද සැලකිල්ලට ගෙන මෙකී බේරුම්කරණ ප්‍රදානය, ප්‍රදානය කර ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

තව ද, ඉහත එකඟ වූ පරිදි යම් හෙයකින් වගඋත්තරකරු විසින් පිට පිට වාරික දෙකක් ගෙවීම නොසලකා හැරියහොත් හෝ වර්ෂ 2021.10.30 දින වන විට සම්පූර්ණ මුදල ගෙවා නිම නොකළහොත් මෙකී සමථය කඩ කළා සේ සලකා මෙතෙක් ගෙවා ඇති සියලු මුදල් අඩු කොට මුල් ගිවිසුමට අනුව අවුරුද්දක් ගතවුව ද ඉතිරි මුදල් හා ඒ මත ගිවිසුම්ගත පොළිය ද ලබා ගැනීම සඳහා අද දින දෙනු ලබන බේරුම්කරණ ප්‍රදානය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ මහාධිකරණයේ බලාත්මක කොට නොතිසි රහිතව ඇස්කිසි ගැනීමට ඉල්ලුම්කාර සමාගමට අයිතියක් ඇති බවටත්, ඒ සඳහා වැය වන සම්පූර්ණ මුදල් වගඋත්තරකරුවන් විසින් දැරීමටත්, ගිවිසුමේ පරිදි දඩ පොළිය ගෙවීමටත් වගඋත්තරකරුවන් එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

තව ද, බේරුම්කරණ ගාස්තු සම සමව දැරීමට දෙපාර්ශවය එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

*එසේම, සමථ කොන්දේසි අනුව,*

ඉහත සඳහන් නඩුවේ පෙත්සමේ ඉල්ලා ඇති පරිදි පෙත්සම්කරුගේ වාසියට තීන්දුවක් හා තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීම සඳහා 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

එසේ වුව ද, 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් පහත සඳහන් ලෙස ගෙවන්නේ නම්, මෙම නඩුවේ තීන්දු ප්‍රකාශය සපිරුවාලූ සේ සැලකීමට පෙත්සම්කරු එකඟ වූ බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු මුදල රුපියල් එකසිය දහඅට ලක්ෂ පනස් දහස් අටසියය (රු. 11,850,800.00) කට සීමා කිරීමට පෙත්සම්කරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

එකී රුපියල් එකසිය දහඅට ලක්ෂ පනස් දහස් අටසියය (රු. 11,850,800.00) ක මුදල පහත සඳහන් ලෙස ගෙවන්නේ නම් තීන්දු ප්‍රකාශය ඉටු කළා සේ සැලකීමට පෙත්සම්කරු එකඟ වූ බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

එනම්, එකී රුපියල් එකසිය දහඅට ලක්ෂ පනස් දහස් අටසියය (රු. 11,850,800.00) ක මුදල දින 90ක් ඇතුළත එනම් 2022 ජූලි මස 07 වැනි දිනට හෝ එදිනට පෙර 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරු වෙත ගෙවීමට එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

යම් හෙයකින් 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් ඉහත කී මුදල වර්ෂ 2022 ජූලි මස 07 වන දින එකඟ වූ පරිදි නොගෙව්වහොත් තීන්දු ප්‍රකාශය ඇතුළත් කොට අවුරුද්දක් ගත වුව ද නොතීසි නොමැතිව ඒ වන විට ගෙවා ඇති මුදල් සඳහා අඩු කිරීම් ලබාදීමෙන් පසුව පෙත්සමේ ආයාචනයේ ඉල්ලා ඇති සහනයන් ලබා ගැනීම සඳහා ඇස්කිසි ගැනීමට පෙත්සම්කරුට අයිතිය ඇති බවත්, එසේ ඇස්කිසි ගැනීමට සිදුවුවහොත් ඒ සඳහා වැය වන සියලු වියදම් සියලුම වගඋත්තරකරුවන් විසින් ගෙවිය යුතු බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටු කිරීමට වගඋත්තරකරුවන් විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක CHC/590/21/ARB දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, කොළඹ වාණිජ මහාධිකරණයේ ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2024ක් වූ අගෝස්තු මස 22 වැනි දින නිසිලෙස තහනම් කරන ලද වගඋත්තරකරුවන්ට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025ක් වූ මැයි මස 23 වැනි දින පෙ. ව. 11.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75%ක මුදල දින 30ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, කොළොන්නාව නගර සභා සීමාව තුළ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, අංක 510, මීතොටමුල්ල ග්‍රාම නිලධාරි වසම තුළ මීතොටමුල්ල අඹතලෙන් පහළ පිහිටි බොදවත්ත නමැති ඉඩමට බී. රණතුංග බලයලත් මානක තැනගේ අංක 170/2006 හා 2006.07.20 දරන ප්ලෑනය ප්‍රකාර (එම්. ඒ. ජයරත්න බලයලත් මානක තැනගේ අංක 5037 හා 2004.11.19 දරන ප්ලෑනය ප්‍රකාර වෙන් කළ අංක X1A සහ 5037A සහ 2005.06.04 දරන ප්ලෑනය ප්‍රකාර වෙන් කළ අංක X1B යන ඉඩම් කොටස් දෙක ඒකාබද්ධ කර නැවත මැන සකස් කරන ලද) කැබලි අක්ෂර A දරන කොටසට මායිම්, උතුරට : රම්‍යා ද ආබෲ ට අයත් ඉඩම ද, නැගෙනහිරට : ගීතාන්මන්ද ආබෲ මාවත ද, දකුණට : එම්. ඒ. සිරිපාලට අයත් ඉඩම සහ මෙම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : කාණුව සහ එම්. ජී. සර්ණේලිස් අප්පුට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම තුනක් (පර්. 21.30) *හෙවත්* හෙක්ටයාර 0.5387 ක් විශාල ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ. මෙය කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 66/117 පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම*.- දෙමටගොඩ - කොළොන්නාව පාරේ වැල්ලම්පිටිය දෙසට ගමන් කරන විට හමුවන කොළොන්නාව තෙල් පිරිපහදුවේ ප්‍රධාන පිවිසුම් ගේට්ටුව ඉදිරියෙන් පිහිටි මීතොටමුල්ල පාර ඔස්සේ මීටර් 800ක් පමණ ඉදිරියට ගිය පසු හමුවන තුංමන් හංදියෙන් දකුණට ඇති මාර්ගයේ මීතොටමුල්ල බස් ඩිපෝව දෙසට තවත් මී. 25ක් පමණ ගියවිට දකුණු පැත්තේ ඇති ආබෲ මාවත නම් වූ කොන්ක්‍රීට් අසුරන ලද පාර ඔස්සේ තවත් මී. 40ක් පමණ ඉදිරියට ගොස් දකුණු දෙසින් පිහිටි 3 වන ඉඩම් කට්ටිය වේ.

ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025ක් වූ අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ, වාණිජ මහාධිකරණයේ දී ය.

04 - 117

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

01. කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ප්‍රවර්ධන කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම.
02. ජනතාවගේ සදාචාරාත්මක හා සංස්කෘතික අගයන් සුරැකීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.
03. අඩු ආදායම්ලාභී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායී ලෙස ඉටුකර ගැනීමට පහසුවන පරිදි පාසල්වලට භෞතික හා ගුණාත්මක වශයෙන් ආධාර හා අනුබල ලබා දීම.
04. උසස් අධ්‍යාපනය සඳහා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීම.
05. ජාති, ආගම්, කුල බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම සහ විවිධ උත්සව හා තරග පැවැත්වීම.

ආචාර්ය එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මඩකලපුව දිස්ත්‍රික්කය.

04 - 133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.